# මධ්‍යම පළාතේ නිවාස මාතා තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

මධ්‍යම පළාත් සමාජ සුබසාධන පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ උඩපේරාදෙණියේ පිහිටි ටිකිරි සෙවණ රජයේ භාර ගැනීමේ ළමා නිවාසයේ පවතින නිවාස මාතා තනතුරු 03 ක් සඳහා පුරප්පාඩු පිරවීමට මධ්‍යම පළාත තුළ පදිංචි සුදුසුකම් ලත් ස්ත්‍රී පක්ෂයෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. අධ්‍යාපන සුදුසුකම්**

i. අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් හෝ ඒ සමාන විභාගයකින් අංක ගණිතය/ ගණිතය / සිංහල/දෙමළ සහ සෞඛ්‍ය විද්‍යාව යන විෂයන් ඇතුළුව සම්මාන සාමාර්ථ 03 ක් සහිතව විෂයයන් 06 කින් එකවර සමත්ව තිබීම.

**සහ**

ii. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද ස්වේච්ඡා ළමා නිවාසයක හෝ නිවාසවල වසර 02 කට නොඅඩු කාලයක් අඛණ්ඩ සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**02. පොදු සුදුසුකම්**

i. අයදුම්කාරියන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

ii. විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

iii. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට මධ්‍යම පළාත තුළ පූර්වාසන්න වසර තුනක අඛණ්ඩ ස්ථිර පදිංචියක් තිබිය යුතුයි. අදාළ නිවාසය පිහිටි දිස්ත්‍රික්කය තුළ පදිංචි අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

iv. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් නොලැබුවෙකු විය යුතුය.

**03. වයස් සීමාව**

i. අයදුම්කරුවන් වයස අවුරුදු 25 ට නොඅඩු හා 45 ට නොවැඩි අය විය යුතුය.

ii. දැනටමත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**04. වැටුප් පරිමාණය : MN-1-2006(A)**

රු. **13120-10x145-11x170-10x240-10x320-22040/=**

**තනතුරු ස්ථිරය :** විශ්‍රාම වැටුප් සහිතය. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුස්සන් තෝරාගනු ලැබේ. තමන් විසින්ම සකස් කරන ලද අයදුම්පත්‍ර **2016.04.06** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ, **ලේකම්, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, තැ. පෙ. 121, සංඝරාජ මාවත, මහනුවර** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තනතුරේ නම ලියුම් කවරයේ වම්පස කෙළවරෙහි සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථාන ගත වන අයදුම්පත් සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය වගකියනු නොලැබේ.

**ලේකම්,**
**සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන සහ**
**පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය,**
**මධ්‍යම පළාත.**